# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 423/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 10/03/2024<br>පැය 1335 |

**මාධ්‍ය නිවේදනය**

**මත්ද්‍රව්‍ය භාවිතා කරමින් සාදයක් පැවැත් වූ සැකකරුවන් 19 දෙනෙකු හා සැකකාරියන් 08 දෙනෙකු අත්අඩංගුවට - කහතුඩුව පොලිස් ස්ථානය.**

2024.03.08 වන දින සවස් කාලයේදී කහතුඩුව පොලිස් වසමේ මාගම්මන ප්‍රදේශයේ නිවසක පිරිසක් මත්ද්‍රව්‍ය භාවිතා කරමින් සාදයක් පවත්වන බවට කහතුඩුව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර සැකකරුවන් 19 දෙනෙකු හා සැකකාරියන් 08 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර සැකකරුවන් තිදෙනෙකු සන්තකයේ හැෂ් මත්ද්‍රව්‍ය ද, සැකකරුවන් තිදෙනෙකු සන්තකයේ මත්පෙතිද තිබී සොයා ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් හා සැකකාරියන් අවුරුදු 20 හා 22 අතර වයස්වල පසුවන පොළොන්නරුව, දෙහිඅත්තකණ්ඩිය, ගාල්ල, මහනුවර, දියතලාව යන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අත්අඩංගුවට ගත් පිරිසෙන් 2024.03.09 වන දින හැෂ් මත්ද්‍රව්‍ය ළඟ තබාගැනීම සම්බන්ධයෙන් සැකකරුවන් දෙදෙනෙකුද, මත්පෙති ළඟ තබාගැනීම සම්බන්ධයෙන් සැකකරුවන් තිදෙනෙකුද, දිවා කාලයේ අයාලේ යාම සම්බන්ධයෙන් සැකකාරියන් තිදෙනෙකුද, අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව හැෂ් මත්ද්‍රව්‍ය ළඟ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනා හට රුපියල් ලක්ෂයක් බැගින් වූ ශරීර ඇප 02ක් මත මුදාහල අතර චෝදනාපත්‍ර ගොනු කිරීම 2024.04.04 දිනට නියෝග කර ඇත. මත්පෙති ළඟ තබාගෙන සිටි සැකකරුවන් තිදෙනා 2024.03.14 දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. දිවා කාලයේ අයාලේ යාම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කාන්තාවන් තිදෙනා සමාජ රෝග සම්බන්ධ වෛද්‍ය වාර්තාවන් කැඳවීම සඳහා 2024.03.14 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

කහතුඩුව පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**